දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2013 පරීක්ෂණය - 2016 සැප්තැම්බර්
Bachelor of Arts General (External) Degree Part I 2013 Examination - September 2016

# ආවිසා 2.1 - සූක්ෂම ආර්ථික න්‍යාය
# ECG 2.1 - Micro Economic Theory

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. "පාරිභෝගික හැසිරීම විග්‍රහ කිරීමේ ලා ආන්තික උපයෝගීතා විශ්ලේෂණය හා උපේක්ෂා වක්‍ර විග්‍රහය අනුගමනය කරනුයේ එකිනෙකට වෙනස් ක්‍රියා මාර්ග දෙකක් වන නමුත් ඒවායින් එළඹෙන අවසාන නිගමනයන් එක හා සමාන වේ." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වනවා ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 20 යි)

02. භාණ්ඩයක මිල වෙනස්වීමක ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය වෙන්කර ගැනීම සඳහා යොදා ගත හැකි ආදායමේ වන්දි විචලන ක්‍රමය, ආදායමේ සමාන විචලන ක්‍රමය යන ක්‍රියා මාර්ගයන්හි වෙනස්කම් සාමාන්‍ය භාණ්ඩයක මිල අඩු වීමක් උදාහරණයට ගෙන උපේක්ෂා වක්‍ර ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 20 යි)

03. (අ) සම නිෂ්පාදන වක්‍ර විග්‍රහය භාවිත කරමින් "ආන්තික ශිල්පීය ආදේශන අනුපාතය" යන්න පැහැදිලි කර යෙදවුම් හි ආන්තික ඵලදාව හා එහි ඇති සම්බන්ධතාව විස්තර කරන්න.

(ලකුණු 10 යි)

(ආ) සම නිෂ්පාදන වක්‍ර සිතියමක් උපයෝගී කර ගනිමින් පහත සඳහන් අවස්ථාවලදී ප්‍රශස්ථ සාධක සංයෝගය වෙනස් වන ආකාරය විස්තර කරන්න.

i. මුළු පිරිවැය හා අනෙකුත් යෙදවුම් හි මිල ගණන් නොවෙනස්ව තිබියදී එක් යෙදවුමක පමණක් මිල අඩු වීම.

ii. යෙදවුම් හි මිල ගණන් නොවෙනස්ව තිබියදී නිෂ්පාදනය සඳහා යොදා ගන්නා මුළු පිරිවැය වැඩිවීම.

(ලකුණු 10 යි)

04. (අ) ආයතනයක කෙටිකාලීන නිෂ්පාදන පිරිවැය හා දිගුකාලීන පිරිවැය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

(ආ) ආයතනයක කෙටිකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රයේ හැඩය තීරණය කරන සාධකම දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රයේ හැඩය ද තීරණය කිරීමට අදාල වනවා ද? ආයතනයක කෙටිකාලීන පිරිවැය වක්‍රවල හා දිගුකාලීන පිරිවැය වක්‍රවල හැඩය රූප සටහන් මගින් ඉදිරිපත් කරමින් ඒවාට තුඩු දෙන හේතු ද පැහැදිලි කරමින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 10 යි)

(ඇ) L හැඩයේ (L-Shaped) දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය යන්න විස්තර කරන්න.

(ලකුණු 05 යි)

05. (අ) $Q = 400 - 20P$ යනු ඒකාධිකාරයකුගේ ඉල්ලුම් ශ්‍රිතයකි. මෙම ඉල්ලුම් ශ්‍රිතය අදාල කරගෙන ඒකාධිකාරී ආයතනයක මුළු අයභාරය ආන්තික අයභාරය හා ඉල්ලුම් නම්‍යතාව අතර ඇති සම්බන්ධය තහවුරු කරන්න.

(ලකුණු 07 යි)

(ආ) “ඒකාධිකාරයාට නිශ්චිත සැපයුම් වක්‍රයක් නැත.” ඒකාධිකාරය සම්බන්ධ මෙම ප්‍රකාශයට පදනම් වී ඇති හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

(ඇ) “ඒකාධිකාරයා ඉල්ලුම් වක්‍රයේ අනම්‍ය කොටසෙහි සිය නිෂ්පාදනය තීරණය නොකරයි.” මෙම ප්‍රකාශයට ඔබ එකඟ වනවා ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 05 යි)

06. (අ) ඒකාධිකාරී ආයතනයක් ස්ථාවර, ආන්තික පිරිවැය සහ සාමාන්‍ය පිරිවැය තත්ත්වයන් යටතේ භාණ්ඩ නිෂ්පාදනය කරන බව සලකන්න. ඒ අනුව ඒකාධිකාරයාගේ $AC = MC = 20$ වේ. මෙම ඒකාධිකාරයා මුහුණ දෙන වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය $P = 40 - 2Q$ වේ. මෙම තොරතුරු අදාළ කරගෙන,

i. ඒකාධිකාරයා ලාභ උපරිම කරන මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

ii. මෙම වෙළෙඳපොළ පූර්ණ තරඟකාරී එකක් බවට පරිවර්තනය වුවහොත් මෙම භාණ්ඩය සඳහා වන සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

iii. මෙම වෙළෙඳපොළ පූර්ණ තරඟකාරී තත්ත්වයේ නොවී ඒකාධිකාරී තත්ත්වයේ පැවතීම හේතුවෙන් අහිමි වී යන ශුද්ධ සුභසාධනය (අහිමිවන සමාජ සුභසාධනය) ගණනය කරන්න.

(ලකුණු 10 යි)

(ආ) ඒකාධිකාරී තරඟ ආයතනයක දිගුකාලීන සමතුලිත අවස්ථාව පූර්ණ තරඟ ආයතනයක දිගුකාලීන සමතුලිත අවස්ථාව හා සන්සන්දනය කරන්න.

(ලකුණු 10 යි)

07. (අ) "සාධක ඉපයීම් සම්බන්ධයෙන් සාධක හිමියන්ට, වඩා වාසිදායක වනුයේ සාධක වෙළෙඳපොළ මෙන්ම භාණ්ඩ වෙළෙඳපොළ ද පූර්ණ තරගයේ පැවතීමයි." සාධක වෙළෙඳපොළ මෙන්ම භාණ්ඩ වෙළෙඳපොළ ද අපූර්ණ තරගයේ පවතින අවස්ථාවක් සමග සන්සන්දනය කරමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

(ආ) "ශ්‍රම වෙළෙඳ පොළ තුල වැටුප් ඉහල දමා ගැනීම සඳහා වෘත්තීය සමිති ශ්‍රම සැපයුම් වක්‍රයට බලපෑම් කිරීමෙන් ඇතිවන ප්‍රතිඵල ශ්‍රමික පාර්ශවයට වාසිදායක වේ යැයි නිස්චිතව කිව නොහැකිය. එහෙත් වෘත්තීය සමිති ශ්‍රම ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් කිරීමට ක්‍රියා කිරීමෙන් ඇතිවන ප්‍රතිඵල ශ්‍රමික පාර්ශවයට වාසිදායක යයි නිස්චිතව කිව හැකිය." මෙම ප්‍රකාශයේ සත්‍ය/අසත්‍යතාව පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

08. පහත සඳහන් සංකල්ප දෙකක් විස්තර කරන්න.

(අ) වැටි රේඛා

(ආ) කතිපයාධිකාරය පිළිබඳ කුනෝට්ගේ විග්‍රහය

(ඇ) කාටලය

(ඈ) ආර්ථික බදු කුලිය

(ලකුණු 20 යි)

❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖